# නගරයේ දවසක්



ඩබ්.එම් සනුති සයුමිතා

8 ශ්‍රේණිය A

# නගරයේ දවසක්


## ඩබ්.එම් සනුති සයුමිතා

කතෘ

මහ/මහමායා බාලිකා විදුහල

8 ශ්‍රේණිය A


2026/05/10


ISBN 978624-211-286-2

# පිදුම

ආදරණීය

මහාමායා මාතාවට

ගෞරවයෙන්

පුද දෙමි...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා හාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාළිගාව<br>
2026.05.10

**මෙ**ය ගිම්හාන සෘතුවේ මැද භාගයයි. අධික අව් රශ්මිය හේතුවෙන් අවට පරිසරයේ ද ඇත්තේ විඩාපත් බවකි. සැලී මෝගන් සහ සේරා ජැනට් යනු විකාර අදහස් හා ගති පැවතුම් ඇති ගැහැණු ළමුන් දෙදෙනෙකි. හොඳම මිතුරියන් වූ මොවුන් දෙදෙනා සාප්පු සවාරි යෑමට මෙවැනි දිනයක් තෝරා ගත්තේ එනිසාම විය හැකියි.

සැලී යනු නිදහස් දිවියක් ගෙවන ගැහැණු ළමයෙකි. වැඩිමහල් අයියලා දෙදෙනෙක් ඇයට සිටින අතර එක් මල්ලි කෙනෙක් සිටියි. ඇය පවුලේ එකම දියණියයි. ඇගේ ගෙදර නීති රීති නැත. දවසින් වැඩි කාලයක් එළිමහනේ ගත කරන ඇය, විවෘත මනසක් ඇති නිදහස් ගති පැවතුම් ඇති ළමයෙකි.

නමුත් සේරා එසේ නොවේ. ඇය පවුලේ එකම දරුවායි. ඒ නිසා මව ඇයට මහත් සේ ආදරය කරයි. ඒ නිසා ඇගේ ආරක්ෂාව සඳහා ගෙදර නීති රීති සියයකට අධික සංඛ්‍යාවක් පනවා ඇත. නමුත් ඇයට අවශ්‍ය වූයේ සාරා මෙන් නිදහසේ කාලය ගත කිරීමටයි. ඇයට එසේ අවස්ථාවක් ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. ලැබුණු මෙම අවස්ථාව ඉහළින්ම සමරන්න දෙදෙනාම සිතා ගත්හ.

“අම්මී... මම එහෙනම් යනවා...” පැවසූ සේරා කලබලයෙන් නිවසින් එළියට පැන ගත්තේ මවගේ අවවාද නැවත මතක් කිරීමෙන් බේරීමටයි. නමුත් ඇගේ මව “පරිස්සමින් ගිහින් එන්න පැටියෝ” කියා බෙරිහන් දෙන හඬ පාරේ දිව යන සේරාට ඇසුණි.


Saly
Sera.

මද දුරක් දිවගිය සේරා බස් නැවතුම්පොළ වෙත ළඟා විය එහි කුඩයක් ඉහළාගෙන ඉන්න සැලීව ඇයට දක්නට ලැබුණි. ඉන්පසු දෙදෙනාම බසයක් එනකම් බලා සිටින්නට විය. දැඩි සූර්ය රශ්මියත් සමග එසේ සිටගෙන සිටීම ඔවුන්ට මදක් අපහසු විය. නමුත් වාසනාවට ඔවුන්ට එසේ බලා සිටීමට අවශ්‍ය වූයේ නැත. රොකට්ටුවක් මෙන් එතනට කඩා වැටුණු බස් රිය නොනවත්වා නලාව නාද කරන්නට විය. කඩිමුඩියේ බසයට නැග ගත් මොවුන් අසුනක වාඩි වී ජනේලය ඇරියේ උණුසුම් මඳ පවන බසය තුළට ගමන් කරන්න ඉඩ සලසමිනි.

බස් රථය වේගයෙන් ධාවනය වන්නට විය. එවිට හමා එන සුළං පහර කෙතරම් ප්‍රබල වූයේ ද යත් එය සැලීගේ දිග කොණ්ඩය අවුල් කර මුහුණ වසාගන්නට සමත් විය.

“වධකාර කොණ්ඩය” ඇය කොණ්ඩය බඳිමින් පැවසුවාය.

“හැබැයි මේ හුළඟ නම් හරිම සනීපයි” ඇය නැවත පැවසුවාය.

“ හරි , හරි ඒක නෙවෙයි අපි මොනවා හරි කමු ද? අම්මි මට සැන්ඩ්විච් ටිකක් හදලා දුන්නා. ඔයා කැමතියි නේද චීස් සැන්ඩ්විච් කන්න ”

පැවසූ සේරා තම බෑගයෙන් සැන්ඩ්විච් පිරුණු පෙට්ටියක් පිටතට ගත්තා ය.

ඉන්පසු ඔවුන් සැන්ව්ච් කමින් ඕපාදූප කතාබහේ යෙදුණාහ.

"බහින්න බහින්න නගරයෙන් බහින කට්ටිය බහින්න........" කොන්දොස්තර කෑගහන හඬ ඔවුන්ට ඇසුනි.

" ෂා දන්නෙම නැතුව ටවුමට ම ඇවිත් බලන්න සේරා ඔයාගේ සැන්ඩ්විච් වලට කාල තරණය කරන්න පුළුවන්ද කොහෙද....."

සැලී සිනාසෙමින් කිව්වේ සේරාගේ පිටට තට්ටුවක් ගසමින් ය.

" විකාර" සේරා කිව්වේ හිස ගස්සා බසයෙන් බහින අතරතුරේ දී ය.

දෙදෙනාම බසයෙන් බැස පාර දිගේ ඇවිද යන්නට වූයේ කිසිම බලාපොරොත්තුවක් සිතේ නැතුවය. අව්ව ඉතා සැර නිසා දෙදෙනාටම අවශ්‍ය වූයේ ඉක්මනින්ම කඩයක් ඇතුලට රිංගා ගැනීමට ය.

"මම නම් කැමතියි මුලින්ම ඇඳුම් ගන්න යන්න" සැලී කිව්වේ දෙදෙනා අතර තිබූ නිහඬතාවය බිඳිමිනි. "හොඳයි එහෙනම්" සේරා කිව්වේ තම අව් කණ්ණාඩි දෙක පළඳිමිනි.

කිසි දිනෙක මෙතරම් රස්නෙ දිනක එළිමහනේ නොසිටි ඇයට මෙය අමුතු අත්දැකීමක් විය.

ඉන්පසු ඔවුන් දෙදෙනා ඇඳුම් කඩයකට ඇතුළු විය. තට්ටු පහකින් සමන්විත එහි ස්වයංක්‍රීය දොරවල් සවිකර තිබුණි. ඊට මෙහා පැත්තේ අවන්හලක්ද පිහිටා තිබුණි.

පිටතින් එය ආකර්ෂණීය වුවත් එහි කෑම රස නැති බව සැලී අත්දැකීමෙන් දනී.

ඇඳුම් කඩයට ඇතුළු වූ මොවුන් දෙදෙනාට පළමුව දැනුනේ ඇතුළතින් හමා එන වායු සමීකරණ යන්ත්‍රයේ සීතල සුළඟ ය. මෙතරම් රස්නෙ දවසක එවැනි සුළඟක් වැදීම පිළිබඳ ඔවුන් සතුටු වූහ.

" ඔයා මොකක්ද ගන්නේ? " සැලී ඇසුවේ කිසිවක් සිතාගැනීමට නොහැකිවය.

" අනේ... මම දන්නේ නෑ.... ගවුමක්වත් බලමු ඉතින්"

ඉතා කෙටි සාකච්ඡාවකින් පසු ඔවුන් ඇඳුම් අතරේ අතුරුදන් වූවා ය. මද වේලාවකින් සැලීට තමා කැමති ගවුමක් සොයා ගත හැකි වුවද ඇයට සේරා සොයා ගැනීමට අපහසු විය. ඇය කඩයේ අස්සක් මුල්ලක් නෑර පරීක්ෂා කළාය. අවසානයේ ඇයට ඉබාගාතේ ඇවිද යන සේරාව සොයා ගත හැකි විය.

"ඔයා කොහෙද ගියේ.... මම ඔයාව හැමතැනම හෙව්වා" දෙදෙනාගේම මුවින් පිටවූයේ එකම වචන පෙළය. එය ඇසුණු දෙදෙනාටම සිනා පහළ විය.

"හරි , හරි මට පෙන්නන්න බලන්න ඔයාගේ ගවුම" සේරා ඇසුවේ තම නෙත් වලින් සැලීගේ ගවුම දෙස බලමිනි.

" මෙන්න බලාගන්න" කියූ සැලී තම ගවුම ඇය දෙසට විසි කළා ය.

“ෂා.... මේක නම් විශ්වාස කරන්නත් බෑ.... ඔයා තෝරගෙන තියෙන්නේ මම තෝරා ගත්ත ගවුම ම තමයි. ඒකෙ කිසි සැකයක් නෑ” කියූ සේරා තම ගවුම සැලීට පෙන්නුවාය. එය දැක දෙදෙනාම සිනාසෙන්නට විය.

එම ගවුම ලා රෝස සහ දම් පැහැය මිශ්‍ර ගවුමකි. එහි යොදා ඇති සුදු ඉරි යෙදූ රටාව නිසා එයට ලැබී ඇත්තේ විකාර එහෙත් හුරුබුහුටි පෙනුමකි. එනමුත් එය මිතුරියන් දෙපළට මනාව ගැළපුණි.

දහවල් දෙක පමණ වන විට ඔවුන් සිටියේ මහ පාරේ ය. දහවල් ආහාරය මගහැරීම නිසා දෙදෙනාටම බඩගින්න එක හා සමානව දැනුණි.

“රස්නෙත් වැඩියි. මට බඩගිනිත් වගේ, ඉක්මනට ඇතුලකට යාගන්න ඕන...” සේරා ඇවිට්ලි කරන්නට විය.

“ රෙස්ටුරන්ට් එකකට යමු” සැලී තම සිතේ තිබූ අදහස එකවර කියා දැම්මා ය.

“ හොඳ අදහස අයිස් ක්‍රීම් එකකුත් කන්න පුළුවන්” සේරා සතුටින් පැවසුවා ය.

“අර තුංමං හන්දිය ගාව අලුත් රෙස්ටුරන්ට් එකක් දාල. ඉතාලි රෙස්ටුරන්ට් වලින් හොඳම කෑම ජාති තියෙන්නෙ ඒකෙලු” සැලී කිව්වා ය.

සේරා හිස සලා එහි යෑමට තම කැමැත්ත පළ කළාය. පැය භාගයක් ගතවීමට පෙර ඔවුන් සිටියේ ඉතාලි අවන්හල ඉදිරියෙනි. ඔවුන්ගේ කුසගින්න මගින් ඔවුන්ගේ ගමන ඉක්මන් කළා කිව්වොත් නිවැරදියි.

පිටතින් එහි පෙනුම ප්‍රියමනාපය. පිරිසිදුය. අලංකාර ස්ථානයක සාදා තිබූ එය තට්ටු තුනක ගොඩනැගිල්ලකි. එය ඉතාලි කොඩියේ වර්ණ වලින් පින්තාරු කර තිබුණි. එහි ඉදිරිපස වහලයේ "Italy palace" යනුවෙන් සඳහන් වී තිබුණි.

මේකද ඒ රෙස්ටුරන්ට් එක? එළියෙන් නම් හරි පෙනුමයි"

" ඔව් මේක තමයි යමු ඇතුලට"

ඉතින් ඔවුන් ඇතුලට ගියහ. එහි ඇතුලත ද මනරම් ආකාරයට නිමකර තිබුණි. බොහෝ පාරිභෝගිකයින් එහි සිටි අතර ඔවුන් නොයෙක් දේ කරති. සමහරුන් කෑම ඇනවුම් කරති. සමහර අය කෑම භුක්ති විඳිති. තවත් සමහර අය කෑම එනතුරු ෆෝන් එක ඔබමින් සිටිති. තවත් සමහරු අය කෑමවල සහ කෑමත් සමග පින්තූර ගනිති.

මේ අතර මිතුරියන් දෙදෙනා මේසයක් මත හිඳ ගත්හ. මද වේලාවකින් වේටර්වරයා ආහාර වට්ටෝරු පොත ද රැගෙන පැමිණියේ ය.

"අපි දෙන්නා පීට්සා එකක් ඕඩර් කරමු ද? " සේරා යෝජනා කළා ය.

"හොඳයි එහෙනම්. චීස් පීට්සා එකක් ඕඩර් කරමු. ඔයා කොහොමත් චීස් වලට කැමතියි නේ"

වේටර්වරයාට තමන් කැමති කෑම ඇනවුම් කළ දෙදෙනා සතුටු සාමීචි කතාබහේ යෙදුණහ. ඔවුන් කතා කලේ අද දවස ගතකළ ආකාරය ගැනයි.

“ඉතින් අද දවස ගැන මොකද හිතන්නේ?” සැලී ඇසුවේ තම මිතුරියගේ අදහස් දැන ගැනීමට ය.

“ ගොඩක් හොඳයි මට හරිම සතුටුයි. මෙච්චර සතුටින් හිටපු දවසක් ගැන මට නම් හිතාගන්න බෑ”. සේරා පැවසුවේ ප්‍රීතියෙනි.

“ අපි ගත්ත ඇඳුම්, ඒවා සෑහෙන්න හොඳයි. ඒ විතරද? අපි මුළු නගරෙම ඇවිද්දා” සැලී පැවසුවේ උද්දාමයෙන් ය.

“ ඇත්තටම ඇඳුම් ගැන නම් මට නොහිතා ඉන්නම බෑ. ඒ දෙක එක ම වගේ අපි ඒ දෙක ඇඳගෙන පාරේ යනකොට කට්ටිය හිතයි අපි දෙන්න නිවුන්නු කියලා” සේරා එක හුස්මට කියාගෙන ගියා ය.

“ඔව්” සැලී සතුටින් පිළිතුරු දුන්නේ තම මිතුරියගේ මනෝ විකාර වලට සවන් දෙමිනි.

නමුත් ඔවුන්ගේ කතාවලට බාධා කරමින් සේරාගේ දුරකථනය නාද වන්නට විය. ෆෝන් එක දෙස බැලූ සේරා මුළු ඇඟම සීතල වන්නට විය .

“ Phone screen” එකේ ඉංග්‍රීසි අකුරින් සඳහන් වූයේ “Amma” යන වචනයයි. එම දුරකථන ඇමතුම සේරාගේ අම්මාගෙනි.

“හෙලෝ අම්මා…” ඇය කතා කළා ය.

“හෙලෝ සේරා නේද මේ කතා කරන්නේ?”

“ ඔව්” ඇය කෙටි පිළිතුරු ලබා දෙන්න හැකිතාක් වෑයම් කළා ය.

“ අනේ ඔයාට මහන්සි පාටයි පැටියෝ.... ඒකයි කටහඬ එකපාරම අඳුරගන්න බැරි වුණේ” ඇය නිදහසට කරුණු ඉදිරිපත් කළා ය.

“හරි හරි අම්මි ඇයි අම්මා කතා කළේ?” සේරා ඇසුවේ තම සිතේ ඇති සැක සංකා දුරු කර ගැනීමට ය.

“ඔයාලා දෙන්නා හොඳින් ද කියලා බලන්න ගත්තේ” ඇගේ පිළිතුර විය.

“ අපි හොඳින් අම්මේ”

“ මතකයි නේද දූ, මම ඔය ගමන යන්න අවසර දුන්න වගේ ම මම ඔයාලට පිළිපදින්න කියපු අවවාද එහෙම මම හිතනවා ඔයා ඒවා සැලීටත් කියන්න ඇති කියලා. දූ ඔයා ඒවා එකක්වත් කඩන්නේ නැතුව අකුරටම පිළිපදිනවා නේද ?ඔයාගේ කටහඬින් නම් මට ඒක පිළිගන්න බෑ. මම ඔයාට කිව්වා ගොඩක් මහන්සි වෙන්න එපා කියලා. ඒකෙන් ඔයා ලෙඩ වෙන්න පුළුවන්. සැලී ගැන නම් බයවෙන්න දෙයක් නෑ. එයා මේ ටවුම ගැන හොඳට දන්නවා! මම මේ අහන්නේ පැටියෝ ඔයා ගැන”

අම්මගේ අවවාද පිළිබඳව ඇයට මතක් වූයේ එවිට ය.

# නීති රීති සංග්‍රහය

- කවදාවත් නොදැකපු නොගිය කඩවල් වලින් කෑම නොකන්න. එවිට ලෙඩවිය හැකියි.
- නොදන්නා අය දෙන කෑම නොකන්න විස විය හැකියි.
- නොදන්නා පුද්ගලයින් සමඟ ගමන් නොයන්න නොදන්නා/ භයානක ස්ථාන වෙත රැගෙන යා හැකියි.
- නොදන්නා පුද්ගලයින් සමග කතාබහට නොයන්න. අනවශ්‍ය දේවල් වලට පෙළඹවිය හැකියි.
- නොදන්නා වීදි වල, පාරවල්වල නොයන්න අතරමංවිය හැකියි.
- සැමවිටම සැලීත් සමගම සිටින්න.
- සවස 5.00 වීමට පෙර අනිවාර්යයෙන් නිවසට පැමිණෙන්න.

“ආ..හොඳයි අම්මි.. මේ... මම මේ කිව්වේ... එකක්වත් කැඩුවෙ නැහැ කියලා....”

“එහෙනම් හොඳයි කිසි කරදරයක් නෑ.... මොකද ඒවා කැඩුවෙ නෑනේ... මතකයිනේ පැටියෝ හවස පහවෙන්න කලින් මම ඔයාව බලාපොරොත්තු වෙනවා. මම එහෙනම් තියන්නම්. බුදු සරණයි ! මැණික good bye ”

“Good bye අම්මී...” (ෆෝනය කට් විය)

ෂූ..... අම්මා දැනගත්තනම් අපි ඉන්නේ Italy palace එකේ කියලා, මට හොඳටම බනියි.”

“ මොකක්ද කිව්වේ” සැලී ඇසුවා ය.

“ නෑ... මේ මුකුත් නෑ.... මේ... ඔයා කවදා හරි මේ රෙස්ටුරන්ට් එකෙන් කාලා තියෙනවා ද ? සේරාගෙන් පැනයකි.

“ නෑ.... ඒත් මගේ පවුලේ ගොඩක් අය කාලා තියෙනවා... එයාලා කියනවා මෙහෙ කෑම ගොඩක් රසයි වගේම සෞඛ්‍ය සම්පන්නයි කියලා....”. ඒ ඇගේ පිළිතුර විය .

“ආ.... එහෙනම් ඉතින් කමක් නෑ.”

සැලීගේ වචන ඇසූ සේරාගේ සිත මඳක් සැහැල්ලු විය. ඉන්පසු ඔවුන් බලා සිටියේ ඔවුන්ගේ ආහාරය රැගෙන වේටර්වරයා පැමිණෙන තුරුයි.

වැඩිවෙලාවක් ගතවීමට පෙර වේටර්වරයා පැමිණියේ ය.ඔහුගේ අතෙහි වූයේ තරමක ලොකු ට්‍රේ එකකි. එය දෙස බැලූ මිතුරියන්ට දැකගත හැකිවූයේ ඔවුන් ඇණවුම් කළ පීට්සා එක ය.

ඉතින් ඔවුන් නිහඬව ආහාරය භුක්ති විඳින්නට වූහ. ඉඳහිට සේරා තම ෆෝනයෙන් පින්තූර එකක් දෙකක් ගත්තා ය. එපමණකි.

ආහාරය ගෙන අවසන් වූ මොවුන් දෙදෙනා එළියට බැස්සේ අයිස් ක්‍රීම් එකක් කෑමේ ආශාවෙනි. වටපිට බැලූ ඔවුන්ගේ නෙත ගැටුනේ වර්ණවත් වර්ණ ආලේප කර තිබූ අයිස් ක්‍රීම් කඩයකි. එහි නාම පුවරුවේ ලොකු අකුරින්

රු. 150 ට

Scoops 3යි

යනුවෙන් සඳහන් කර තිබුණි තිබුණි. එය දුටු මිතුරියන්ගේ ඉහේ මලක් පිපුණි. ඔවුන් වහා ඒ තුළට රිංගා ගියේ ය.

"එකසිය පනහක් කියන්නේ ලොකු ලාභයක්" සැලී කීවාය.

"ඒක ඇත්ත තියෙන තැනත් හොඳයි වගේ. කඩෙත් හොඳයි වගේ.ප්‍රශ්නයක් වෙන එකක් නෑ"

සේරා තමාටම මුමුණා ගත්තේ මවගේ අවවාද මතක් වීම හේතුවෙනි.

ඔවුන්ට වැඩි වේලාවක් කතා කිරීමට නොහැකි විය. වේටර්වරයා මෙනු පත් දෙකක් රැගෙන එතැනට පැමිණියේ ය. එහි විවිධ අයිස් ක්‍රීම් වර්ග අඩංගු විය. ඔවුන් අයිස් ක්‍රීම් වර්ග තුනක් තෝරා ගත යුතු වන අතර එවිට එම අයිස් ක්‍රීම් වර්ග තුන උපයෝගී කරගෙන අයිස් ක්‍රීම් දෙකක් සෑදේ.

“ ඔයා මොනවාද තෝර ගන්නේ?” සැලී සේරාගෙන් ඇසුවා ය.

“ඩබල් චොකලට් එකයි, චොකලට් චිප්ස් එකයි, මින්ට් චොකලට් එකයි” සේරා කියාගෙන ගියා ය.

“ බුදු අම්මෝ ඔක්කොම චොකලට් නේ, අහගන්නකෝ... මම නම් ඔක්කොම පලතුරු ජාති තෝරා ගත්තේ..... මැන්ගො එකයි, Banana එකයි, ස්ට්‍රෝබෙරි එකයි”

“හොඳ තේරීමක්” සේරා සිනාමුසුව කිවුවත් ඇය සැබවින්ම චොකලට් පෙරේතියක් ම විය.

එය ඉතා රස්නෙ දිනයක් බැවින් කඩය තුළ සෙනඟ පිරෙන්නට විය. ඔවුන් ඇනවුම් කළ ආහාර ලැබීමට ටික වේලාවක් ගතවන බව වේටර්වරයෙක් ඔවුන් දැනුවත් කළේ ය.

එම කඩයෙහි නැරඹීමට දේ ඕනෑතරම් තිබුණි. කඩයෙහි තිබූ සෑම බිත්තියකම සෑම අඟලක්ම වැසෙන්න ඇඳ තිබුණේ අලංකාර චිත්‍රය. සැලී තම මව සමග දුරකථන සංවාදයක නිරත වෙමින් සිටි නිසා ඇය සමඟ කතා කිරීමට නොහැකි ය.

සේරා තම මවට දුරකථන ඇමතුමක් ගැනීමට කිසිසේත් සිතුවේ නැත. එසේ කළහොත් ඇයට සිදුවන්නේ මවගේ දේශනවලට සවන් දීගෙන සිටීමට ය. එබැවින් ඇය චිත්‍රවල පින්තූර ගනිමින් සහ ඒවා සිරි නරඹමින් කාලය ගත කළා ය.

මද වේලාවක් මව සමඟ කතා කළ සැලී දුරකථනය මේසය මත තැබුවා ය. එවිට ඇගේ නෙත ගැටුණේ වේටර්වරයා ඔවුන් ඇනවුම් කළ දේවල් රැගෙන එන අයුරුයි.

"සේරා... ඔයා ඔය ෆොටෝ පස්සේ ගහන්න දැන් මෙතනට ඇවිත් වාඩිවෙන්න" සැලී සේරා ඇමතුවා ය.

" ඇයි අනේ.... මට පාඩුවේ ඉන්න දෙන්නකෝ..."

"බෑ....ඕඩර් කරපුවා එනවා ...."

සැලීට එය කියා අවසන් කිරීමට අවශ්‍ය නොවී ය. එම වාක්‍යයේ අවසන් වචනය කීමට පෙර සේරා මේසයට විත් වාඩි වී සිටියා ය.

ඉන්පසු ඔවුන් දෙදෙනා වේටර්වරයා ගෙනත් දුන් අයිස් ක්‍රීම් රස විඳින්න විය. ඒවා ඉතා වර්ණවත් මෙන්ම රසවත් ද විය.

ඔවුන් ඔවුන්ගේ ආහාර සතුටින් භුක්ති විඳින්නට විය. මෙතරම් රස්නෙ දිනයක මෙවැනි දෙයක් කෑමෙන් ඔවුන්ගේ ඇඟ සිසිල් විය.ඔවුන් ආහාර ගෙන එළියට එන විට හවස තුන හමාර පමණ විය.

"3.30 යි දැන් අපි මොකද කරන්නේ? ගෙදර අයට මොනවා හරි ගමුද?" සැලී ඇසුවා ය.

" හොඳයි මොනවා ද? " සේරා තම කැමැත්ත පල කළා ය.

" කෑමක් තමයි ඉතින් මම නම් ගන්නේ."

ඇය සිනාසුනා ය.

මද වේලාවකට පසු ඔවුන් කඩවල් පේලියක් දුටුවා ය. ඒ අද දින පැවැත්වීමට නියමිතව තිබූ එළිමහන් සැණකෙළියකි. පාරේ කෑම කරත්ත රාශියක් නවතා තිබුණි. බාබකියු කරන ලද මස්, තෙලේ බදින ලද අල තීරු, Hot dog" හැම්බර්ගර්, පැණිරස කැවිලි වර්ග ඒවායේ අලෙවි කිරීමට තිබුණි.

ලෙමනේඩ්, බබල් ටී, Soft drinks" පලතුරු බීම සරුවත් වැනි පාන වර්ග විකිණීමට ද තිබුණි.

" ෂා.... මෙහෙම දෙයක් තියෙනවා කියලා මම දැනගෙන හිටියේ නැහැ නේ" සැලී පුදුමයෙන් පැවසුවා ය.

" ඔයාට මුළු ගමකටම කන්න කෑම මෙතනින් අරගෙන යන්න පුළුවන්" සේරා පැවසුවේ සතුටිනි.

" ඔයා දන්නව ද? අද දවසට අපි කොච්චර දේවල් නම් කෑව ද? ඒත් මේක දකිද්දි නම් මට ආයෙත් බඩගිනියි වගේ...." සැලී සිනාසෙමින් පැවසුවා ය.

" ඔයාට විතරක් නෙවෙයි අනේ... මටත් එහෙමමයි." සේරා ද මිතුරියගේ සිනාවට එක් වෙමින් පැවසුවා ය.

සේරා මේ වන විට මවගේ අවවාද භාගයක් හෝ ඊට වඩා කඩ කර අවසන් ය. ඇය ගෙදර යන විට කීමට බොරු කිහිපයක් ගෙතිය යුතු බව ඇය දැන සිටියා ය. නමුත් මේ දැන් ඒකට වේලාව නොවේ. දැන් ඔවුන් විනෝද වන වේලාවයි.

ඔවුන් සැණකෙළියේ නොකළ දෙයක් නොමැත. ඔවුන් නොකෑ දෙයක් නොමැත. ඔවුන් රසවත් අඹ අච්චාරු වල රස බැලූහ. ලෙමනේඩ් දෙකක් බී හමාර කළහ. ගෙදර අයට ගෙන යෑම සඳහා රසකැවිලි, හොට්ඩෝග් සහ බාබකියු අල චිප්ස් මිලදී ගත්හ.

මීට අමතරව ඔවුන් දිනුම් ඇදීමකට ද සහභාගි වූහ .සේරා එයින් කළු සහ සුදු පැහැති රෝස කම්මුල් සහිත යෝධ පැන්ඩාවෙකු ද සැලී එයින් දිදුලන කළු ඇස් ඇති රෝස පැහැති හුරතල් වලසෙකු ද දිනා ගත්හ.

" මේක නම් මට අදහගන්නත් බෑ අපි වියදම් කළේ රු. 150 යි ඒත් බලන්නකෝ අපිට ලැබුණු තෑගි. මට නම් හරි සතුටුයි."

" මටත් එහෙමයි. ඒක නෙවෙයි දැන් වෙලාව කීයද දන්නෙම නැතුව කාලයත් ගෙවිල ගිහින්." සේරා සැලීගෙන් ඇසුවා ය. ඇය සිතුවේ දැන් වේලාව හවස හතර පමණ වන්නට ඇතැයි කියා ය.

" දැන් වෙලාව 4.30 යි." සැලී තම අත් ඔරලෝසුව දෙස බලමින් පැවසුවා ය.

" නෑ.... වෙන්න බෑ... මොකක්ද ඔයා කිව්වේ...." සේරා භීතියෙන් සැලී දෙස බැලුවා ය. ඇගේ තිබූ සන්සුන් ස්වභාවය එහෙම පිටින් ම නැති වී ගොසිනි.

" දැන් වෙලාව හතර හමාරයි ඇයි මොකක් හරි ප්‍රශ්නයක් ද? " සැලී කුතුහලයෙන් ඇසුවා ය.

“ අනේ සැලී හවස පහට කලින් ගෙදර ගියේ නැත්නම් අම්මා හොඳටම කලබල වෙයි... අපි මේ දැන්ම ගෙදර යන්න ඕන... මේ දැන්ම” එසේ කියූ සේරා සැලී වත් ඇදගෙන බස් නැවතුම්පොළ වෙත දිව යන්නට විය. සැලී ට කිසිවක් සිතාගත නොහැකි විය. තුෂ්නිම්භූත වූ ඈ සේරා පසුපස නිහඬව දිව යන්නට විය.

බසයක් එනතෙක් ඔවුන්ට කාලය නාස්ති කිරීමට අවශ්‍ය නොවීය. බස් නැවතුම්පළේ බසයක් නවතා තිබුණි. එය සේරාගේ සිතට සහනයක් ගෙන දුන්නා ය. ඔවුන් බසයට නැගුණු සැනින් එය ධාවනය වන්නට විය.

සේරාට කුමක් කිව යුතු දැයි සිතාගත නොහැකි විය. ඇය බොරු කීම සුදුසුද? කිව යුතු බොරුව කුමක්ද? ඇය සිතන්නට විය.

“අතරමං උනා කියන්නත් බෑ... එහෙම කිව්වොත් ආයේ කවදාවත් මට මෙහෙම විනෝද වෙන්න බැරි වෙයි.” ඇය සිතන්නට විය.

“ ඇත්තම කියනවා ද? නෑ.... බස් එක කැඩුනා කියනවා ඔව්, ඒක හොඳයි.”

ඇය බොරුවක් සිතා ගත්තා ය. මිතුරියගේ කැලඹුණු ස්වභාවය නැති වෙනවා දුටු සැලී ද සතුටට පත් විය.

මේ වන විට බසය ඔවුන්ගේ නිවාස ආසන්නයටම ළඟා වී ඇත. ඉතින් මේ ඔවුන් ළඟාවන්නේ එක්තරා ප්‍රීතිමත් දවසක අවසානයකට ය.

~ සමාප්තයි ~



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978624-211-286-2